# 7 මානව සංහතියේ ඒකත්වය හා සංස්කෘතික විවිධත්වය

කිසියම් එක් ජන කොටසකට හෝ එක් භූමි ප්‍රදේශයකට හෝ සීමා නොවන, සමස්ත මානව සංහතිය සඳහා මඟ පෙන්වන දහමක් ලෙස මානව වර්ගයාගේ ඒකත්වය තහවුරු කිරීම බුදු දහමෙහි මූලික අවශ්‍යතාවක් වේ. මෙම පාඩමෙන් අප හදාරනුයේ බුදු දහම මගින් එය සිදු කරනු ලබන ආකාරයයි.

## 7.1 හැඳින්වීම

මානව වර්ගයා යනු එක ම සත්ත්ව කොට්ඨාසයක් බවත් මිනිසුන් එකිනෙකාගෙන් වෙන් කොට දැක්විය හැකි කායික හෝ මානසික ලක්ෂණ නැති බවත් බුදුරදුන් පෙන්වා දී ඇත. එම සත්‍යයට අනුව සියලු මානව සංහතිය එකිනෙකා අතර කිසිදු වෙනසක් නැති එක ම ජන සමූහයක් ලෙස සලකා අප ක්‍රියා කළ යුතු ය. එහෙත් අනිත් අතට මානව සමාජය සංස්කෘතික, ආගමික, භූගෝලීය හා සාමාජික සාධක අනුව විවිධ කොටස්වලට බෙදී පවතින බව ද සත්‍යයකි. ගැටලුව වන්නේ අප මානව වර්ගයාගේ ඒකත්වය හා මානව සමාජයේ විවිධත්වය යන දෙකරුණ හමුවෙහි නිවැරැදි ව හැසිරිය යුත්තේ කෙසේ ද යන්නයි. මෙම පාඩම තුළින් ඔබට එම ගැටලුවට විසඳුමක් ද ලැබෙනු ඇත.

## 7.2 බුදුදහම මානව වර්ගයාගේ ඒකත්වය තහවුරු කරන්නේ ඇයි?

බුදුරදුන්හට ගිහිගෙයින් නික්ම බුද්ධත්වය ලබා ගැනීම සඳහා මූලික හේතුව වූයේ ලෝක සත්ත්වයා පත් ව ඇති දුක්ඛිත තත්ත්වයට විසඳුමක් සෙවීම සඳහා වූ බලවත් අභිලාෂය බව අපි මීට පෙර දුටුවෙමු. සියලු සත්ත්වයා දුකට භාජන ව ඇති බවත් ඉන් මිදීමේ අභිලාෂය සියල්ලන් තුළ පවත්නා බවත් බුදුදහමේ මූලික පිළිගැනීම් දෙකකි. දුක පිළිබඳ ප්‍රශ්නයේ දී ජාති භේද, කුල භේද, ස්ත්‍රීපුරුෂ ලිංග භේද හෝ දුප්පත් පොහොසත් ආදි භේද හෝ තිබිය නො හැකි ය. එසේ නම් දුකෙන් මිදීමේ අභිලාෂය සියලු දෙනාට පොදු වන අතර ඒ සඳහා වන ප්‍රතිපදාව ද සියල්ලන්ට පොදුවේ විවෘත විය යුතු ය.

මෙම බෞද්ධ මතය බුද්ධකාලීන බ්‍රාහ්මණ සමාජයෙහි ඉගැන්වීමට මුළුමනින් ම පටහැනි විය. බමුණන්ගේ අදහස වූයේ ඔවුන් පමණක් පාරිශුද්ධියට පත්වන බවයි. “ගෞතම ශ්‍රමණ තෙමේ කුල සතරෙහි ම සාමාජිකයන්හට පිරිසුදු විය හැකි බව ප්‍රකාශ කරයි”යි ඔවුහු උන්වහන්සේට චෝදනා ද කළහ. එහෙත් උන්වහන්සේගේ අදහස වූයේ උත්සාහය හා ප්‍රඥාව ඇති සියලු දෙනාට කවර හෝ භේදයකින් තොර ව විමුක්තිය ලබා ගත හැකි බවයි. මෙම “විශ්ව පාරිශුද්ධිය” තහවුරු කිරීමේ කාර්යයෙහි මුල් පියවර වූයේ සමස්ත මානව සංහතිය ම එක් සත්ත්ව කොට්ඨාසයක් බව තහවුරු කිරීමයි. බුදුරදුන් මානව සංහතියෙහි ඒකත්වය තහවුරු කිරීමට මෙපමණ වෙහෙස වූයේ එබැවිනි.

## 7.3 මානව වර්ගයාගේ ඒකත්වය

මානව සංහතියෙහි ඒකත්වය තහවුරු කිරීමට අවශ්‍ය ඉතා වැදගත් කරුණු කීපයක් බුදුරදුන් විසින් වාසෙට්ඨ හා භාරද්වාජ යන තරුණ බමුණන් දෙදෙනාට පැහැදිලි කොට ඇත.

ඉන් ප්‍රධාන ම කරුණ මෙසේ ය: තෘණ හා වෘක්ෂලතා අතර ද සිවුපාවුන්, පක්ෂීන්, කෘමීන්, උරගයන් හා මත්ස්‍යයන් යන සත්ත්ව කොට්ඨාස අතර ද එකිනෙකාගෙන් වෙනස් ලක්ෂණ ඇත. මෙම සත්ත්ව හා ශාක අතර එකිනෙකින් වෙනස් ජාති පවතී. නිදසුනක් ලෙස සිවුපාවුන් අතර, සිංහ, ගව, මුව,

උෟරු, බළල් ආදි විවිධ ජාති ඇත. එක් එක් ජාතියට අයත් ශරීර ලක්‍ෂණ වෙනස් ය. හැසිරීම් ද වෙනස් ය. එම ලක්‍ෂණවලින් යුත් ඔවුන්ගේ ජාතිය ඔවුන් හඳුනා ගැනීමේ සලකුණ වේ. එහෙත් මනුෂ්‍ය වර්ගයා අතර එකිනෙකා වෙන් කොට හඳුනා ගත හැකි කිසිදු ශාරීරික ලක්‍ෂණයක් හෝ චර්යාත්මක ලක්‍ෂණයක් හෝ නැත.

මෙම ජීව විද්‍යාත්මක සාධකය මගින් පැහැදිලි වනුයේ අනිකුත් සත්ත්වයන් තුළ හා ශාකවල මෙන් ජාති හෙවත් වර්ග මිනිසා තුළ නැති බවයි. එසේ නම් මිනිසුන් වර්ග කළ හැක්කේ කෙසේ ද යන ප්‍රශ්නය පැන නගී. ඒ සඳහා  බුදුරදුන් දෙන පිළිතුර නම් මිනිසා තමා කරන ක්‍රියා අනුව වර්ග කළ හැකි බවයි. මනුෂ්‍යයා නිවැරැදි ව හැඳින්විය යුත්තේ උස්, පහත්, බ්‍රාහ්මණ,  වසල වැනි නම්වලින් නොව ඔහුගේ හැසිරීම හෝ වෘත්තිය හෝ රැකියාව හෝ පදනම් කොට ගෙන ය. ඒ අනුව ගොවිතැන් කරන්නා ගොවියකු විනා බ්‍රාහ්මණයෙක් නො වේ. වෙළෙඳාම් කරන්නා වෙළෙන්දකු මිස බමුණකු නො වේ.  එම ආකාරයෙන් ම කෙනකු උසස් හෝ පහත් වනුයේ තම හැසිරීමෙන් විනා අනිකකින් නොවේ. මෙම කරුණ බුදුරදහු මෙසේ සාරාංශ කොට දක්වති:

**න ජච්චා වසලෝ හෝති – න ජච්චා හෝති බ්‍රාහ්මණෝ,**
**කම්මනා වසලෝ හෝති – කම්මනා හෝති බ්‍රාහ්මණෝ.** (වසල සූත්‍රය)

(කෙනෙක් උපතින් පහත් කෙනෙක් හෝ උසස් කුලවතෙක් හෝ නොවේ. ක්‍රියාවෙන් පමණක් වසලයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ වේ.)

බ්‍රාහ්මණ, වසල ආදී ගෝත්‍ර නාම හුදෙක් සමාජ සම්මතයන් පමණක් ම බවත් කෙනකු සත්‍ය වශයෙන් ම බ්‍රාහ්මණයකු වන්නේ යහපත් ගුණ ධර්ම අනුගමනය කිරීමෙන් පමණක් බවත් බුදුරදහු අනතුරුව පෙන්වා දෙති. මෙම සාකච්ඡාව අවසන් කරමින්  බුදුරදුන් වාසෙට්ඨ හා භාරද්වාජ බමුණු තරුණයන් දෙදෙනාට පෙන්වා දෙන්නේ බුදුදහමෙහි බ්‍රාහ්මණයකු ලෙස හෙවත් උසස් කුලවතකු ලෙස හැඳින්වෙන්නේ සියලු කෙලෙසුන් නැසූ රහතන් වහන්සේ බවයි.

ඉහත සඳහන් ජීව විද්‍යාත්මක සාධකයට අමතර ව, මනුෂ්‍ය සංහතියේ ඒකත්වය පැහැදිලි කිරීම සඳහා බුදුරදුන් වෙනත් සාධක ද දක්වා ඇත. ඒ අතර තරමක් ගැඹුරු දාර්ශනික / මනෝවිද්‍යාත්මක සාධකයක් නම් සත්ත්වයා ස්කන්ධ පහකට බෙදා විග්‍රහ කොට දැක්වීමයි.  එම විග්‍රහය කුමක්දැයි අපි බලමු.

බුදුදහමට අනුව මනුෂ්‍යයා සකස් ව ඇත්තේ ස්කන්ධ යනුවෙන් දැක්වෙන අංග පහක් එකට එක්වීමෙනි. ඒවා නම්, **රූප** හෙවත් නිරතුරු වෙනස් වීමේ ලක්‍ෂණයෙන් යුතු භෞතික රූපය (ද්‍රව්‍යය = ශරීරය), **වේදනා** හෙවත් එම භෞතික රූපයට සුවපහසු, රළු  ගොරෝසු ආදී ස්පර්ශ නිසා ඇතිවන වින්දන හා මනසට සොම්නස්දොම්නස් වැනි වින්දන ලැබීම, **සඤ්ඤා** හෙවත් ඇස, කන ආදී ඉන්ද්‍රියයන්ගෙන් රූප, ශබ්ද ආදී අරමුණු ගැනීම, **සංඛාර** හෙවත් තිදොරින් නිරතුරු ක්‍රියා කිරීම හා **විඤ්ඤාණ** හෙවත් මනසින් අරමුණු දැනගැනීම යනුයි.

මනුෂ්‍යයා පිළිබඳ මෙම විග්‍රහයෙන් පැහැදිලි වන ඉතා ම වැදගත් කරුණ නම් මෙම ස්කන්ධ පහෙහි ක්‍රියාකාරිත්වය විනා ස්ථාවර ව, නො වෙනස් ව පවත්නා යමක් හෙවත් **ආත්මයක්** ඔහු තුළ නැති බවයි. මේ තුළින් අපට මෙම ස්කන්ධ පහ කිසිසේත් ම ස්ථාවර ව, නොවෙනස් වන ධර්ම නොවන බව උපමා පහකින් දක්වා ඇත. ඒ අනුව රූපය පෙණ පිඬක් බඳු ය. වේදනාව දිය බුබුළක් වැනි ය. සඤ්ඤාව මිරිඟුවක් වැනි ය. සංස්කාර කෙසෙල් කඳක් වැනි ය. (අරටුවක් නැත).  විඤ්ඤාණය මායාවක්, ඇස් බැන්දුමක්  වැනි ය. මෙබඳු ස්වභාව ඇති ස්කන්ධ ස්ථාවර සේ ගත නො හැකි ය. එම ස්කන්ධවලින් සැදුණු සත්ත්වයා වූ කලී හුදෙක් එම අංශවල එකතුවට කියන නමක් පමණි. එය හරියට ම රථයකට අවශ්‍ය විවිධ කොටස් එකට ගැළපූ විට ‘රථය’  යැයි කියන්නාක් මෙනි. කොටස්වල එකතුවට අමතර ව රථයක්

නැතිවාක් මෙන් ම ස්කන්‍ධවල එකතුවට අමතර ව ආත්මයක් ද නැත. එයින් මෙම සාකච්ඡාව සඳහා ලබා ගත හැකි වටිනා නිගමනය නම් බ්‍රාහ්මණ බව හෝ වසල බව, නැතහොත් උසස් බව හෝ පහත් බව ලෙස ගත හැකි නො වෙනස්වන යමක් අප කිසිවකු තුළ නැති බවයි. එබන්දක් කිසිඳු ස්කන්‍ධයක හෝ ඒ පහේ එකතුවෙහි හෝ දක්නට නැත. එසේ නම් සෑම මනුෂ්‍යයකු ම හුදු ස්කන්ධ පහක ක්‍රියාකාරීත්වයක් පමණි.

ඉහත සාකච්ඡාවෙන් අප දුටු පරිදි, මනුෂ්‍යයා ඔහුගේ ක්‍රියා අනුව වර්ග කළ හැකි ය. මෙම කරුණ ම සදාචාරය පැත්තට යොමු කළ විට අපට පැහැදිලි වනුයේ තිදොරින් හොඳ ක්‍රියා කරන විට අප හොඳ පුද්ගලයන් වන බවත් ඒවායින් නරක ක්‍රියා කරන විට අප නරක පුද්ගලයන් වන බවත් ය. රහතන් වහන්සේලා හැරෙන විට සදාකාලික හොඳ පුද්ගලයන් හෝ සදාකාලික නරක පුද්ගලයන් හෝ නැත්තේ ඇයිදැයි ඔබට දැන් පැහැදිලි වනු ඇත.

## 7.4 මානව සමාජයේ විවිධත්වය

මානව වර්ගයා අතර ජාති හෙවත් වර්ග විවිධත්වයක් නැති වුව ද, ලෝකයෙහි විවිධ මානව සමාජ දකින විට අපට එම සමාජ කොට්ඨාස අතර පැහැදිලි විවිධත්‍වයක් පෙනේ. කාලගුණික හා පාරිසරික සාධකවලට අනුව ශරීර වර්ණයෙන් ද, ඇඳුම් පැළඳුම්වලින් හා ආහාරපානවලින් ද ආගමික සාමාජික හා ඓතිහාසික තත්ත්වයන්ට අනුව භාෂාවෙන් හා ආගමෙන් ද මෙම විවිධත්‍ව මතු ව පෙනේ. මෙම සියල්ල එක් කොට ගත් විට ඒවා සංස්කෘතිකමය වෙනස්කම් ලෙස පුළුල් දෘෂ්ටිකෝණයකින් දැක්විය හැකි ය.

## 7.5 සංස්කෘතික විවිධත්වය කෙරෙහි පිළිපැදිය යුත්තේ කෙසේද?

කිසියම් ජන කොටසක් තම සංස්කෘතිය කෙරෙහි කැමැත්තක් දැක්වීම, එයට ඇලුම් කිරීම ස්වාභාවික කරුණකි. එහෙත් මෙහි දී ඇතිවිය හැකි ගැටලුවක් නම් එක් එක් ජන කොටසක් තම සංස්කෘතියට, භාෂාවට, ආගමට හා රටට පක්‍ෂපාතී වන විට විවිධ ජන කොටස්වල හැඟීම් අතර ගැටුමක් ඇතිවිය හැකි වීමයි. ඉතිහාසය දෙස බලන විට පෙනී යන්නේ ලෝකයේ විවිධ ජනයා තම ආගම, භාෂාව, රට වැනි කරුණු හේතුවෙන් එකිනෙකා හා සටන් කොට ඇති බවයි.

ලොව එක ම භාෂාවක්, එක ම ආගමක් හා එක ම සංස්කෘතියක් වේ නම් එබඳු ආරවුල් අවම වනු ඇතැයි අපට සිතිය හැකි ය. එසේ ම ගෝලීයකරණය හේතු කොට ගෙන මුළු ලොව පුරා සමාන ලක්‍ෂණවලින් යුතු සංස්කෘතියක් බිහිවන ලකුණු ද පෙනේ. එහෙත් එසේ ඇතිවිය හැකි විශ්ව සංස්කෘතිය ලොව බලවත් ම රටෙහි හෝ රටවල හෝ සංස්කෘතිය වන බැවින් අවසන් ප්‍රතිඵලය වන්නේ අනිකුත් සියලු සංස්කෘතීන් අභාවයට යාම ය. එහෙයින් ආගම, භාෂාව, රට වැනි කරුණු හේතු කොට ගෙන ඇතිවන ප්‍රශ්නවලට විසඳුම ඒවා සමාජයෙන් නැති කර දැමීම නොව, සමාජයෙහි සංස්කෘතික බහුත්වය හා විවිධත්‍වය පිළිගත හැකි පුළුල් මානසික ආකල්ප මිනිසුන් තුළ ඇති කිරීම ය.

ආගම සම්බන්ධ ව පමණක් නොව භාෂාව, ජාතිය, රට වැනි මේ සෑම කරුණක දී ම තමා තුළ තම ආගම, භාෂාව හා රට පිළිබඳ ව ඇති බැඳීමට සමාන බැඳීමක් තවත් කෙනකුට ඔහුගේ ආගම, භාෂාව හා රට පිළිබඳ ව ඇති කර ගැනීමට ඇති අයිතිය ද අප විසින් පිළිගත යුතු ය. මානව සංහතියේ ඒකත්‍වය පිළිබඳ අදහස මෙහි දී අපට ඉතා ප්‍රයෝජනවත් වේ. මිනිසුන් වන අප සියලු මිනිසුන්ගේ හැඟීම්, අදහස් හා රුචි අරුචිකම් කෙරෙහි සංවේදී විය යුතු ය. **අත්තූපනායික ධර්ම පර්යාය** ද (5.1 ඒකකය බලන්න.) අප මෙහි දී සිත්හි දරා ගත යුතු ය. ඒ අනුව අප විසින් කළ යුත්තේ තමා උපමා කොට අන්‍යයන්ගේ ද හැඟීම්වලට ගරු කරමින් ජීවත්වීමට පුරුදු වීම ය.

## 7. 6 සාරාංශය

බුදුදහමේ ආභාසය යටතෙහි ඉතා සදාචාර සම්පන්නවූත් ආර්ථිකය අතින් සශ්‍රීක වූත් සමාජයක් ශ්‍රී ලංකාවෙහි බිහිවිය. එය ප්‍රමාණයෙන් කුඩා වුවත් ගුණාත්මක අතින් වූ අගය හේතු කොට ගෙන ලොව පුරා ප්‍රකට විය. බුදුදහම පදනම් කොට ගෙන සිංහල ජන සමාජයෙහි බිහි වූ මෙම සංස්කෘතිය සිංහල බෞද්ධ සංස්කෘතිය විය. මෙම සංස්කෘතික පරිසරය තුළ භික්ෂූන් වහන්සේ කුල දේවතාවුන් ලෙසට සලකමින්, ගුරුන්, දෙගුරුන් හා වැඩිහිටියන්ට ගරු කරමින් හා සලකමින්, දයාවෙන්, කරුණාවෙන් මිත්‍රශීලීත්වයෙන් හා පරිත්‍යාගශීලිත්වයෙන් යුතු ව වැඩිහිටියන් බවට පත් වීමේ අයිතිය තරුණ ඔබටත්, එබඳු සමාජයක ජීවත් වීමේ අයිතිය අප සැමටත් හිමි ය. අපට උරුම ව ඇති ඓතිහාසික, ආගමික හර පද්ධතිය අප විසින් බැහැර නො කළ යුතු ය. මුල් සහිත, පදනමක් සහිත පුරවැසියන් ලෙස වැඩීම සඳහා හර පද්ධතියක් අපට අවශ්‍ය බැවිනි. අපගේ සංස්කෘතිය අප අගය කළ යුතු අතර අප එය ආරක්ෂා ද කළ යුතු ය. එහෙත් උසස් සංස්කෘතියක හිමිකරුවන් ලෙස අප අපගේ අයිතිවාසිකම් ආරක්ෂා කර ගත යුත්තේ අන් අයගේ අයිතිවාසිකම්වලට හානියක් නොවන අයුරිනි. අප විසින් අපගේ සංස්කෘතියට, ආගමට, භාෂාවට, රටට හා ජාතියට හිතවත් විය යුත්තේ අප සමාජයෙහි වෙසෙන අන් සියලු දෙනා තුළ තම තමන්ගේ සංස්කෘතියට ඇති හිතවත් බවට සංවේදී වෙමිනි.

### අභ්‍යාස

1. මානව වර්ගයාගේ ඒකත්‍වය හා සංස්කෘතික විවිධත්වය හේතුවෙන් ඇතිවන ගැටලුව කුමක් ද?
2. මානව වර්ගයාගේ ඒකත්‍වය තහවුරු කිරීමට බුදුරදුන් පෙන්වා දුන් "ජීව විද්‍යාත්මක" සාධකය පැහැදිලි කරන්න.
3. මානව වර්ගයාගේ ඒකත්‍වය තහවුරු කිරීමට පඤ්චස්කන්ධ පිළිබඳ විග්‍රහය අදාළ වන්නේ කෙසේ ද?
4. පළමු වන ප්‍රශ්නයෙන් දක්වෙන ගැටලුවට නිවැරදි පිළිතුර වන්නේ කුමක් ද?
5. පඤ්චස්කන්ධය කෙටියෙන් හඳුන්වන්න.

### පැවරුම්

1. මානව වර්ගයාගේ ඒකත්‍වය තහවුරු කිරීම බුදුරදුන්හට ඉතා වැදගත් වූයේ කවර හෙයින්දැයි පැහැදිලි කරමින් ඡේදයක් ලියන්න.
2. පහත සඳහන් වචනවල තේරුම සොයා සටහන් පොතට එකතු කර ගන්න.

   | | | | |
   |---|---|---|---|
   | i. ඒකත්‍වය | ii. විවිධත්වය | iii. බහුත්වය | iv. සුවිශේෂතා |
   | v. විකාශනය | vi. ප්‍රාථමික අවස්ථාව | vii. වාරි කර්මාන්තය | viii. සෞන්දර්යය |

3. ගෝලීයකරණය පිළිබඳ ව (අන්තර්ජාලයෙන් හෝ පොත්පත් වලින් හෝ) කරුණු සොයා කෙටි රචනයක් සේ ඉදිරිපත් කරන්න.

### අතිරේක කියවීම්

1. වාසෙට්ඨ සූත්‍රය, මජ්ඣිම නිකාය
2. බුදුදහම හා ජාති ප්‍රශ්නය (ගුණපාල මලලසේකර හා කේ.එන්. ජයතිලක)
3. බුදුන් වදාළ ධර්මය (වල්පොළ රාහුල හිමි (1 පරිච්ඡේදය කියවන්න.)
4. මහාවංසය (38 පරිච්ඡේදය)

නොමිලේ බෙදාහැරීම සඳහා ය